ජාතික පොලිස් කොමිෂන් සභාව
தேசிய பொலிஸ் ஆணைக்குழு
National Police Commission

අංක 9 ගොඩනැගිල්ල, B.M.I.C.H. පරිශ්‍රය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
9 ஆம் இலக்கக் கட்டிடம், B.M.I.C.H.வளாகம், பௌத்தாலோக மாவத்தை ,கொழும்பு 07.
Block No. 9, B.M.I.C.H. Premises, Bauddhaloka Mawatha, Colombo 07.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | NPC/AD/03/23/2025 (VOL II) | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | 02/24/09/02/2025 | දිනය<br>திகதி<br>Date | 2026.03. 16 |

ලේකම්,

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් හා නියාමන සේවා ගණය සඳහා වන සංශෝධිත බඳවාගැනීම් හා උසස් කිරීමේ පටිපාටිය (පොලිස් කොස්තාපල්) සම්බන්ධයෙන් නැවත සංශෝධන අනුමත කරවා ගැනීම**

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් යොමු කරන ලද අංක 02/24/09/02/2025 හා 2026.02.24 දිනැති ලිපිය හා බැඳේ.

02. ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් හා නියාමන සේවා ගණය සඳහා වන සංශෝධිත බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට (පොලිස් කොස්තාපල්) මේ සමඟ අමුණා ඇති ඇමුණුමේ සඳහන් සංශෝධන ඇතුළත් කර ගැනීමට 2026.03.04 වන දින රැස් වූ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දී ඇති බව එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වමි.

03. තවද, එම බඳවාගැනීම් පටිපාටිය ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම් විසින් 2025.06.18 වන දින සහතික කර ඇති බැවින් නැවත සහතික කිරීමක් අවශ්‍ය නොවන අතර, ජාතික පොලිස් කොමිෂන් සභාව මඟින් සිදු කරන ලද සංශෝධනය සටහන් කර ගැනීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

තනුජා එන්. ප්‍රනාන්දු
ලේකම්
ජාතික පොලිස් කොමිෂන් සභාව

පිටපත : පොලිස්පති, පොලිස් මූලස්ථානය - ඔබගේ අංක PHQ/ED & SORP /10/06/2025 හා 2026.02.24 දිනැති ලිපිය පරිදි දැනගැනීම සඳහා සහ ලිපියේ සඳහන් සංශෝධනයන් පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීමටත් ඒ සඳහා නිකුත් කරන ලද ආර්.ටී.එම්. පණිවිඩයේ පිටපතක් ජාතික පොලිස් කොමිෂන් සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කිරීමටත්.

ක්ෂණික ඇමතුම් / உடன் தொடர்பு / Hot Line : **1960 /0710361010**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දුරකථන අංකය<br>தொலைபேசி<br>Telephone | 0112166500 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 0112166555 | විද්‍යුත් තැපෑල<br>மின்னஞ்சல்<br>E-Mail | info@npc.gov.lk | වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>Web Site | www.npc.gov.lk |

සංශෝධන ලැයිස්තුව

| අනු අංකය | ඡේද අංකය | යෝජිත සංශෝධනය | |
|---|---|---|---|
| 1 | 1.6 | නව යොමු අංකය : NPC/AD/03/23/2025( VOL II)<br>දෙවන සංශෝධන අනුමත දිනය 2026.03.04 | 2025.06.18 දින අනුමත කර ඇති බ.ගැ පටිපාටියේ මෙම අනු අංක යටතේ ඇතුළත් කරුණු වලට අමතරව මෙහි සඳහන් යොමු අංකයන් හා දිනයන් ඇතුළත් කරන්න |
| 2 | 7.2 | **7.2** විවෘත බඳවා ගැනීම<br><br>7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ගණිතය, විද්‍යාව, සිංහල/දෙමළ භාෂාව සහ ඉංග්‍රීසි භාෂාව ඇතුලුව විෂයයන් පහක් (05) සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම හෝ<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ගණිතය, සිංහල හෝ දෙමළ භාෂාව ඇතුලුව විෂයයන් 05 ක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වීම සහ<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් එක් වරකදී විෂයයන් දෙකකින් සමත් වීම. | |
| 3 | 7.2.2.5 | 7.2.2.5 වෙනත්.<br><br>iii. අවිවාහක විය යුතුය.<br><br>(දික්කසාද වූවන්, වැන්දඹුවන්, ගර්භණීව සිටීම සහ අවිවාහකව දරුවන් සිටින අයවලුන් සුදුසුකම් නොලබයි.) | |
| 4 | 7.2.4.5 | **7.2.4.5.** පසුබිම් පරීක්ෂණය:<br><br>7.2.4.5.1. ලිඛිත විභාගයෙන් සහ යෝග්‍යතා ඇගයීමේ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව එකතු කොට අයදුම්කරුවන්/අයදුම්කාරියන් ලබාගත් මුළු ලකුණු සංඛ්‍යාව අවරෝහණ ක්‍රමයට සකස් කර ප්‍රමුඛතා ලේඛනයක් සකස් කරනු ලැබේ. ඉන් අනතුරුව පවතින පුරප්පාඩු ප්‍රමාණය | |

| | | |
|---|---|---|
| | | සැලකිල්ලට ගනිමින් එම පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ වන තෙක් අවශ්‍ය අයදුම්කරුවන් ප්‍රමාණයක් පසුබිම් පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.<br><br>7.2.4.5.2. අයදුම්කරුවන්ගේ/අයදුම්කාරියන්ගේ අයහපත් චරිතය අනාවරණය කර ගැනීම සඳහා ඔහු/ඇය හා ඔහුගේ/ ඇයගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු/ ඇය සමීපව ඇසුරු කරන්නන්ගේ ද අයහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව අයදුම්කරු පදිංචි පොලිස් ස්ථානය, පොලිස් විශේෂ කාර්යාංශය හා රාජ්‍ය බුද්ධි සේවය මඟින් පසුබිම් පරීක්‍ෂණ වාර්තා කැඳවනු ලබන අතර, එහි දී අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් /අයදුම්කාරියන් නුසුදුස්සන් සේ සලකනු ලැබේ. |
| 5 | 7.2.4.5 සටහන 03 | සටහන **03**<br><br>අයදුම්කරුවෙකු/ අයදුම්කාරියකගේ අයහපත් පසුබිම් වාර්තා මත ඔහු/ඇය බඳවාගැනීම සඳහා සුදුසු/නුසුදුසු වන්නේද යන්න තීරණය කිරීම පත් කිරීමේ බලධරයා විසින් කළ හැකිය. |
| 6 | 7.2.4.6 | **7.2.4.6.වෛද්‍ය පරීක්‍ෂණය :**<br><br>7.2.4.6.1.<br><br>I. වෛද්‍ය පරීක්ෂණය සඳහා තෝරාගත් අයදුම්කරුවන් විසින් පොදු 169 පෝර්මය සම්පූර්ණ කර පොලිස් රෝහල වෙත ඉදිරිපත් කළ යුතුය.<br>II. මෙහි දී අයදුම්කරුවන් පොලිස් රාජකාරි ඉටු කිරීම සඳහා සුදුසු බවට සහ ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක රාජකාරි කිරීමට සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකට ද භාජනය කරනු ලැබේ.<br>III. එම අයදුම්කරුවන් / අයදුම්කාරියන් පොලිස් රෝහල විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයෙන් සමත්විය යුතුය. (ඇමුණුම VI අනුව)<br>IV. ඉහත II හා III හි සඳහන් පරීක්ෂණවලින් සමත්ව බඳවාගැනීමට සුදුසුකම් ලබන අයදුම්කරුවන් මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වී ඇත්ද යන්න හඳුනාගැනීමේ වෛද්‍ය පරීක්ෂණය සඳහා පොලිස් රෝහල මඟින් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වෙත යොමු කර වෛද්‍ය වාර්තාවක් කැඳවනු ලැබේ.<br>V. සෞඛ්‍ය 169 පෝර්මය, ඇමුණුම VI වෛද්‍ය වාර්තාව හා ඉහත IV හි සඳහන් පරිදි අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මගින් ලබාගන්නා වාර්තාව අනුව යෝග්‍යතාවය තහවුරු කරන අයදුම්කරුවන් පමණක් පවතින පුරප්පාඩු මත බඳවාගැනීම සඳහා සලකා බලනු ලැබේ.<br>**VI.** වෛද්‍ය පරීක්ෂණයට භාජනය විය හැක්කේ එක් වරක් පමණි. |